# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය
எனது இல.
My No.

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2022.11.11

පැමිණිලි පාර්ශවය : 1. එච්.ජ්.එස්.දමයන්ති මිය,
"ගගතිප්‍රිය", සේනානායක පෙදෙස,
පාදුක්ක.

2. අයි.සී.කේ.ජ්. සෙනෙවිරත්න මයා,
අංක : 204/44, සර්වෝදය මාවත,
මාකන්දන, පිලියන්දල.

වගඋත්තර පාර්ශවය : නාවික හමුදාපති,
නාවික හමුදා මූලස්ථානය,
කොළඹ.

<u>පැමිණිලි අංකය : HRC/663/17, HRC/664/17</u>

පැමිණිල්ල :-

ඉහත නම් සඳහන් පැමිණිලිකරුවන් විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, යුධ හමුදාවේ සේවයේ නියුක්තව සේවයට වාර්තා කිරීමෙන් වැළකී සිටි තම පුතුන් වන ඩී.ඩී. පෙරේරා (ජ්ජ් 105113) සහ අයි.ඩී.එස්.එම්. සෙනෙවිරත්න (ජ්ජ් 107401) යන දෙදෙනා පිළිවෙලින් 2016.12.14 දින සහ 2016.12.27 දින රජය විසින් ලබාදුන් පොදු සමා කාලයේදී නාවික හමුදා මූලස්ථානයට භාරවී ඇති අතර, නැවත නාවික හමුදාවට සේවය කිරීමට අකමැති බව ප්‍රකාශ කිරීමෙන් පසුව නාවික හමුදාවෙන් ඉවත් කිරීමට නාවික හමුදාව වෙත අදාළ පුහුණුවීම් වෙනුවෙන් ගෙවිය යුතු මුදල් ප්‍රමාණය සකස් කර ඒ බව ලිපියක් මගින් අදාළ අයවළුන් වෙතට දැනුම්දීමෙන් පසුව නාවික හමුදාව වෙත පැමිණෙන ලෙසට දන්වන ලද බව සඳහන් කර ඇත. නමුත් අදාළ ලිපිය සම්බන්ධයෙන් පැමිණිල්ල වෙත දැනුම්දීමකින් තොරව නාවික හමුදාව විසින් මෙම අයවළුන්ව 2017.02.07 වන දින සහ 2017.02.05 දින අත්අඩංගුවට ගෙන වැලිසර නාවික




ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

හමුදා කඳවුරේ රඳවා සිටීමෙන් පසු ඒ සම්බන්ධයෙන් සොයා බැලීමට නාවික හමුදා කඳවුරට ගිය පසු නාවික හමුදා මූලස්ථානය විසින් අදාල ගෙවීම් ලිපි පැමිණිලිකරුවන්ට භාරදී පිළිවෙලින් රු. ලක්ෂ 3,247,011.59 ක් සහ රු. ලක්ෂ 3,461,348.08 ක් ගෙවන ලෙස ප්‍රකාශ කරමින් එදින සිට රඳවා තබාගෙන සිටින බවට කොමිෂන් සභාව වෙත පැමිණිලි කර ඇත. එසේම, ආරක්ෂක අමාත්‍යාංශය විසින් පොදු සමා කාලයක් ලබාදීමෙන් අනතුරුව අත්අඩංගුවට ගෙන රඳවා තබා ගැනීම තුලින් සහ මීට පෙර මෙලෙස නාවික හමුදාවෙන් ඉවත් වන අයට ගෙවීමට සිදුවූයේ රු. ලක්ෂ 15 කට අඩු ගෙවීමක් වන නමුත්, මෙම අයවළුන්ට පමණක් මෙසේ රු. ලක්ෂ 30 කට වැඩි ප්‍රමාණයක් ගෙවීම් කිරීමට සිදුවීම තුලින් ද ඔවුන්ට අසාධාරණයක් සිදුකර ඇති බවට පැමිණිලි කර ඇත.

මේ සම්බන්ධයෙන් විමර්ශනයක් සඳහා 2017.04.03 දින වගඋත්තරකරුවන් කැඳවා ඇති අතර, වගඋත්තරකරු වෙනුවෙන් ලුතිනන් ඩබ්ලිව්.සී. රොද්‍රිගෝ මහතා සහභාගී වී ඇත. එම අය විසින් කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, මෙම මුදල් ප්‍රමාණය නාවික හමුදාව විසින් නිවැරදි ආකාරයට ගණනය කර ඇති අතර, ඒ සම්බන්ධයෙන් ලිඛිතව ඔවුන් වෙත දන්වා ඇති බවත්, එම මුදල් පැමිණිලිකරුවන් ගෙවා නොමැති බැවින් ඔවුන්ව රඳවා තබා ගන්නා ලද බවත්ය. මොවුන් හා නාවික හමුදාව අතර ඇති ගිවිසුම ප්‍රකාරව මෙම මුදල් ගෙවීමට මොවුන් බැඳී සිටින බවද ප්‍රකාශ කර ඇත. එසේම, මෙම අය පොදු සමා කාලය තුල භාරවී ඇති බව පිළිගන්නා අතර, අත්අඩංගුවට ගැනීම සහ අදාල ගෙවීම් සඳහා කරන ලද දැනුම්දීම් වල ලිපි පිළිබඳ තොරතුරු මීලග පරීක්ෂණයේදී ඉදිරිපත් කල හැකි බව කොමිෂන් සභාව වෙත දන්වා ඇත.

එසේම පැමිණිලිකරුවන් විසින් ඉදිරිපත් කරන මේ හා සමානව නාවික හමුදාවෙන් ඉවත්වූ අයවළුන්ගේ ගෙවීම් සම්බන්ධයෙන් ද සොයා බලා අදාල වාර්තා කොමිසමට ඉදිරිපත් කිරීමට එකග විය.

**නිරීක්ෂණ :-**

පැමිණිල්ලේ සඳහන් එම්.ඩී.ඩී. පෙරේරා සහ අයි.ඩී.එච්.එම්. සෙනෙවිරත්න යන අය නාවික හමුදාව සමග එළඹ ඇති ගිවිසුමට අනුව වසර 3 ක පුහුණුවකින් පසුව වසර 5 ක් නාවික හමුදාව වෙත සේවය කල යුතුව ඇත. මෙම අයවළුන් වසර 5 ක් නාවික හමුදාවට සේවය කර නොමැති අතර, එම වසර 5 ක කාලය අතර තුලදී නාවික හමුදාවෙන් පලාගිය සෙබළුන් වේ.

මෙම ගිවිසුමට අනුව මෙම අයවළුන් ලක්ෂ 15 ක ඇපයකට අත්සන් කර ඇති අතර, මෙම පලාගිය සෙබළුන් දෙදෙනා ආරක්ෂක අමාත්‍යාංශය විසින් ලබාදී ඇති පොදු සමා කාලය තුල එනම්, එම්.ඩී.ඩී.පෙරේරා යන අය 2016.12.27 දින ද, අයි.ඩී.එච්.එම්.සෙනෙවිරත්න යන අය 2016.12.14 දින ද

භාරවී ඇති බව නිරීක්ෂණය වේ. මෙම අය පිළිවෙලින් 2017.02.07 දින සහ 2017.02.05 දින නාවික හමුදාව විසින් අත්අඩංගුවට ගෙන වැලිසර නාවික හමුදා කඳවුරේ රඳවා සිට ඇත.

ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය විසින් මෙම අයට නාවික හමුදාවට අයවිය යුතු මුදල් ගෙවන ලෙසට කරන ලද දැනුම්දීමේ ලිපි වල නිකුත් කර ඇති දිනයන් පිළිවෙලින් 2017.02.09 සහ 2017.02.06 දින වේ.

විමර්ශනයේදී ඉදිරිපත්වී ඇති තොරතුරු අනුව මෙම සෙබළුන් පොදු සමා කාලය යටතේ නාවික හමුදාවට භාරවී ඇති අතර, මොවුන්ව නැවත අත්අඩංගුවට ගෙන ඇති බවත්, අත්අඩංගුවට ගැනීමට පෙර ඔවුන් විසින් නාවික හමුදාවට ගෙවිය යුතු මුදල ඔවුන් වෙත දන්වා නොමැති බවත් නිරීක්ෂණය වේ.

මෙවැනි ආකාරයට නාවික හමුදාවෙන් ඉවත් වී ඇති එච්.එස්.එස්. සිරිවර්ධන (ඒජ් 105143) ඉවත්වීම සඳහා නාවික හමුදාවට ගෙවා ඇති මුදල් වන්නේ රු. ලක්ෂ 1,352,805.32 ක් වේ. එම ලිපියේ පිටපතක් පැමිණිලිකරුවන් විසින් ඉදිරිපත් කර ඇත.

**නිගමනය :-**

මෙම පැමිණිල්ලේ විසඳිය යුතු ගැටළුව වන්නේ, පොදු සමා කාලය තුළ භාරවීමෙන් පසු නැවත අත්අඩංගුවට ගැනීම නිත්‍යානුකූලද නැත්ද යන්න සහ නාවික හමුදාවෙන් ඉවත් වන මෙවැනි අනෙක් සෙබළුන් හා මෙම සෙබළුන්ට වෙනස් කොට සැලකීමක් සිදුකර ඇත්ද යන්නයි.

වින්දිතයින් දෙදෙනා නාවික හමුදාවේ නිල දැන්වීම් වලට අනුව පොදු සමා කාලය යටතේ පිළිවෙලින් 2016.12.14 සහ 2016.12.27 යන දින වල ස්වේච්ඡාවෙන් භාර වී ඇත. ඉන්පසුව නාවික හමුදාව විසින් 2017.02.07 සහ 2017.02.05 යන දින වල 'ඔවුන් නාවික හමුදාවෙන් පලා ගියාය' යන හේතුව මත අත්අඩංගුවට ගෙන ඇති අතර, එසේ අත්අඩංගුවට ගෙන ඇත්තේ පෙර නාවික හමුදාවෙන් පලායාම සම්බන්ධයෙන් නමුත්, ඔවුන් ඒ සම්බන්ධයෙන් පොදු සමා කාලයේ දී භාරවී ඇත. එසේ කර තිබියදී ඔවුන් දෙදෙනා නැවතත් අත්අඩංගුවට ගැනීම තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(1) ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති පැමිණිලි පාර්ශවයේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය =:

ඒ අනුව, මෙම පැමිණිලිකරුවන් අත්අඩංගුවට ගැනීම නීති විරෝධීව සිදුකර තිබීම මත 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(1) වන ව්‍යවස්ථාවේ සඳහන් පැමිණිලිකරුවන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බැවින්, මෙහිදී නිසියාකාරව සිය රාජකාරී කටයුතු ඉටු නොකිරීම සම්බන්ධයෙන් ඊට අදාළ නිලධාරීන් සම්බන්ධයෙන් සුදුසු විනය පියවර ගැනීමට කටයුතු කළ යුතු බවට නාවික හමුදාපති වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2022.12.22 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 (7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

රෝහිණී මාරසිංහ,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික) ,
සභාපතිනි,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

ම.හේ. නිමල් කරුණාසිරි
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- අමාත්‍යතුමා,
ආරක්ෂක අමාත්‍යංශය,
බත්තරමුල්ල.

B/-